# හැඳුනුම්පත් ලබා ගැනීමට අදාළව සම්පූර්ණ කළ ඉල්ලුම්පත් භාරදිය හැකි ආකාර

## සාමාන්‍ය සේවය

ඔබ පදිංචි ග්‍රාම නිළධාරී වසමේ ග්‍රාම නිළධාරී මඟින්

## එක්දින සේවය

ඔබගේ ග්‍රාම නිලධාරී සහතික කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමඟ අනිකුත් ලේඛන ඉදිරිපත් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු වීම මඟින්

## ජාතික හැඳුනුම්පත් එක්දින සේවය

- මෙම සේවාව ලබාගැනීමට, ග්‍රාම නිලධාරී සහතික කරන ලද ඔබගේ ලද පු.ලි.දෙ/වි/ 1,7,8 ඉල්ලුම්පත්‍රයක් සමඟ අනිකුත් ලේඛන නිසි පරිදි ඉදිරිපත් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු විය යුතු ය.

- මෙම සේවාව සඳහා **රු: 1000ක** පරිපාලන ගාස්තුවක් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් අය කෙරේ.

- **සඳුදා සිට සිකුරාදා දක්වා (වැඩකරන දිනයන්හි දී)** පෙ.ව. 8.00 සිට මධ්‍යහන 12.00 දක්වා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් භාරගන්නා අතර ප.ව. 4.15 පමණවන තුරු හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

- එක් දින සේවය සඳහා ඉල්ලුම්පත් භාර දීමට ඉල්ලුම්කරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට **පැමිණීම අනිවාර්ය වේ.** නමුත් විශේෂ අවධානය සහිත පුද්ගලයන් (ශාරීරික, මානසික දුබලතා ඇති / වයෝවෘධ පුද්ගලයන් වැනි අය) ඒ බව ග්‍රාම නිලධාරී / ප්‍රාදේශීය ලේකම් සහතික කල ලිපියක් මගින් තහවුරු කරන්නේනම් මව,පියා, කලත්‍රයා, සහෝදර සහෝදරියන් හෝ නීත්‍යානුකූල භාරකරුට හැඳුනුම්පත භාරදීමේ හැකියාව ඇත.

# <u>හැඳුනුම්පතක් ලබා ගැනීමේදී සම්පූර්ණ කරන ලද</u>
# <u>පු.ලි.දෙ/වි/ 1,7,8 අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු ලේඛන</u>

**1.උප්පැන්න සහතිකයේ මුල් පිටපත**

උප්පැන්න සහතිකයක් නොමැති නම්

- අවු:40 ටඅඩු :- **අනුමාන වයස් සහතිකය**
- අවු:-40 ට වැඩි :- **හිස් ප්‍රතිඵල ලේඛනය**

*සමඟ නම හා උපන්දිනය සනාථ කිරීම සඳහා විධිමත් දිවුරුම් ප්‍රකාශයක් හා ලිඛිත සාක්ෂි (දරුවකුගේ උප්පැන්න සහතිකය / පාසල් හැර යාමේ සහතිකය /විවාහ සහතිකය/ කේන්දරයක ඡායාපිටපත)*

2.බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් නම් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය

- අනෙකුත් ආගමික පූජකවරුන් අදාළ දෙපාර්තමේන්තු මඟින් පූජ්‍යත්වය තහවුරු කර ලබා ගත් සහතිකය
- පැවිදි භාවය /පූජ්‍යත්වය අත්හැර ඇත්නම් ඒ බව තහවුරු කර අදාළ දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් සහතික

**3. ඉහත 1,2 ලේඛන වලට අමතරව මුල් වරට හැඳුනුම්පතක් ලබා ගැනිමේදී**

- රු100.00 ගාස්තුව
- අවු.16 ට වැඩි නම් රු.250 ප්‍රමාද ගාස්තු ගෙවූ රිසිට්පත හා පු.ලි.දෙ/මෙ/02/03 ආකෘතිය

**4. ඉහත 1,2 ලේඛන වලට අමතරව හැඳුනුම්පත අපැහැදිලි,පළුදු වූ විට හෝ සංශෝධනය සඳහා ඉදිරිපත් කිරීමේදී**

- රු.250.00 ගාස්තුව
- දැනට භාවිතා කරන හැඳුනුම්පත
- අංකය අපහැදිලිනම් අංකය සඳහන් ලිඛිත සාක්ෂියක් (බැංකු පොතේ /රියදුරු,විදේශ ගමන් බලපත්‍ර/රැකියා හැඳුනුම්පතෙහි ඡායාපිටපත ආදිය )

**5 ඉහත 1,2 ලේඛන වලට අමතරව අස්ථානගත හැඳුනුම්පතක් වෙනුවෙන්**

- රු.500.00 ගාස්තුව
- පොලිස් වාර්තාව සමඟ අංකය සඳහන් ලිඛිත සාක්ෂි (බැංකු පොතේ /රියදුරු,විදේශ ගමන් බලපත්‍ර,/රැකියා හැඳුනුම්පතෙහි ඡායාපිටපත ආදිය )

**6.අනුමත ඡායාරූපාගාරයකින් ලබාගත් ඡායාරූප රිසිට්පත (Photograph Reference Slip)**

**7.රු 45.00 ක මුද්දර අලවන ලද ලිපිනය නොලියූ දිග ලියුම් කවරයක්**